# D.M.M.M. Wijayarathna

**Attorney-At-Law**
**Notary Public & commissioner for Oaths, Company Secretary**

No-113/4 Doowa waththa Road, Moratuwa,Sri Lanka.
Tel – +94773368833 / +94703368833..email –mmwijayarathna@gmail.com

2025.03.15

සිසිර සෙන්පති කහවත්ත,
අධ්‍යක්ෂ - නව මාධ්‍ය,
ජනාධිපති මාධ්‍ය අංශය,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ.

මහත්මයාණෙනි,

මාගේ සේවාදායකයකු වන මොරටුව, ලක්ෂපතිය, බිෂොප් ටෙරස්, අංක-12/2 ඒ හි පදිංචි දම්පැල්ල ගමගේ රවින්ද්‍ර මනෝජ් කුමාර ( නීතීඥ මනෝජ් ගමගේ ) මහතාගේ උපදෙස් මත මෙම ලිපිය ඔබ වෙත එවමි.

මාගේ සේවාදායක වසර විසි දෙකකට ආසන්න කීර්තිමත් වෘත්තියේ ඉතිහාසයක් ඇති ජ්‍යෙෂ්ඨ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයකු හා සිවිල් ක්‍රියාකාරිකයෙකු වන අතර වර්තමානයේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ මාධ්‍ය ප්‍රකාශක ලෙස කටයුතු කරමින් යුක්ති ගරුක පුරවැසියෙක් ලෙස ජීවත් වන අතර පාසැල් කාලයේ සිට මේ දක්වා කීර්තිමත් ඉතිහාසයක් තුළ කිසිදු දූෂණ වංචා හෝ චරිතය මත අපකීර්තියක් ඇති වූ කිසිදු චෝදනාවක් එල්ල වූ තැනැත්තෙකු නොවන බව ඔහුගේ උපදෙස් මත දන්වා සිටිමි.

ඔබ විසින් ජනාධිපති ලේකම් කාර්යාලයේ ජනාධිපති මාධ්‍ය අංශයේ අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ මාධ්‍ය අධ්‍යක්ෂ ( නව මාධ්‍ය ) ලෙස සේවය කරමින් ජනාධිපති මාධ්‍ය අංශයේ රාජ්‍ය දේපළ අවභාවිතා කරමින් හා අතිගරු ජනාධිපතිතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිළධාරියෙකුට නුසුදුසු හා නොගැලපෙන අන්දමේ චර්යාවන් ප්‍රදර්ශනය කරමින් පසුගියදා කෝප් කමිටුවේදී ඖෂධ නියාමන අධිකාරිය සම්බන්ධයෙන් සාකච්ඡා කෙරුණු කරුණු විකෘති කරමින් තමන්ගේ දේශපාලන අරමුණු මුදුන්පත් කරවා ගැනීම සඳහා අසත්‍ය, පදනම් විරහිත, කරුණු විකෘති කරන ලද, කරුණු සගවන ලද, ද්වේෂ සහගත ප්‍රකාශයන් මාගේ සේවාදායක සම්බන්ධයෙන් සිදු කරමින් පොදු මහජනතාවට ඔහු කෙරෙහි ද්වේෂ සහගත හැඟීම් උද්දීපනය වන ආකාරයෙන් පහත පෝස්ට් කිහිපයක් ෆේස්බුක් සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රසිද්ධ කිරීමට ක්‍රියා කර ඇත.









ඉහත ඔබ විසින් සකස් කර ප්‍රසිද්ධ කල ව්‍යාජ හා/හෝ ද්වේශ සහගත හා/හෝ අසත්‍ය කරුණු ඇතුලත් පෝස්ටුව 2025-03-15 දින පෙරවරු 08.39 වන විට 19200 කට අධික නරඹන්නන් පිරිසක් නරඹා ඇති අතර 500 කට අධික පිරිසක් එය නැවත Share කරමින් ප්‍රසිද්ධ කර ඇත.

තවද ඉහත පෝස්ටුවේ සඳහන් පරිදි මාගේ සේවාදායක බාල බෙහෙත් ගෙන්වූ අධ්‍යක්ෂක මණ්ඩලයේ සිටිමින් නිලධාරීන්ට බලපෑම් කර බවට කිසිදු කරුණක් අනාවරණයේ වී නොතිබියදී ඔහු එලෙස කළ බවට ජනතාව අතර අසත්‍ය ප්‍රකාශයක් දියත් කරමින් මාගේ සේවා දායක කෙරෙහි රටේ පොදු මහජනතාව තුළ බරපතල ද්වේශයක් අප්‍රසාදයක් හා/හෝ අපකීර්තියක් චේතනාන්විතව ඇති කිරීමට ඔබ  ද්වේශ සහගතව උත්සාහ ගෙන ඇති බවට මාගේ සේවාදායකට පැහැදිලිවම පෙනී ගොස් ඇත.

විශේෂයෙන්ම ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ උසස් නිළධාරියෙකු ලෙස ජනාධිපති මාධ්‍ය අංශයේ සේවය කරමින් ඔබ මෙලෙස අසත්‍ය ප්‍රකාශයන් සිදුකිරීම තුළ පෞද්ගලිකව ජනාධිපතිවරයාගේ හා/හෝ ජනාධිපති ලේකම්වරයාගේ අනුදැනුම මත මෙලෙස ක්‍රියා කරනවාද යන සැකය මාගේ සේවා දායකයා තුළ සහ ඔහු නියෝජනය කරන දේශපාලන ප්‍රවාහය තුළ ඇති වීමෙන් අතිගරු ජනාධිපතිතුමාද ජනාධිපති ලේකම්තුමා ප්‍රමුඛ ජනාධිපති ලේකම් කාර්යාලයේ සෙසු කාර්ය මණ්ඩලයද දැඩි අපහසුතාවයකට පත් කරන බවට මාගේ සේවා දායකයා විශ්වාස කරන බවට ඔහුගේ උපදෙස් මත අවධාරණය කර සිටි.

එමෙන්ම හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මාධ්‍ය ප්‍රකාශක ලෙස මාගේ සේවාදායක කටයුතු කරමින් එතුමාගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් ආණ්ඩුවේ  ඇතැම් තීරණ දැඩිව විවේචනය කිරීමට පෙරළා පළිගැනීමක් වශයෙන් ජනාධිපති මාධ්‍ය අංශයේ ප්‍රධානියෙකු වන ඔබ යම් ඉහළ අනුදැනුමක් ඇතිව හා/හෝ නැතිව මෙලෙස ක්‍රියා කිරීම කිසියම් සැලසුම් සහගත ක්‍රියාවලියක කොටසක්ද යන්න මාගේ සේවාදායකයාට බරපතල සැකයක් මතුව ඇති බව මාගේ සේවාදායකයා අවධාරණය කර සිටි.

විශේෂයෙන්ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පැවැත් වූ සියලු පරීක්ෂණවලින් කිසිදු අයථා ක්‍රියාවකට මාගේ සේවා දායක සම්බන්ධ බවට අනාවරණය වී නොතිබීමත් සහ දැනටමත් පවතින නඩු කටයුතු සඳහා අනිසි බලපෑමක් සිදුවන ආකාරයට සිදුවන මෙම ක්‍රියාවලිය තුළ ඔබ එකී අධිකරණ ක්‍රියාවලියන්ටද බලපෑමක් සිදුවන ආකාරයේ අසත්‍ය සහ කරුණු විකෘති කරන ලද නිර්මාණශීලි පෝස්ටු පලකිරීම මගින් ඔබ මාගේ සේවාදායකයාගේ කීර්තිනාමයට හා අයිතිවාසිකම් වලට බරපතළ අගතියක් සිදුකර ඇති බවට මාගේ සේවාදායකයාගේ උපදෙස් මත අවධාරණය කර සිටිමි.

ඉහත සඳහන් තත්ත්වයන් තුළ ඔබ සිදුකර ඇති අසත්‍ය, පදනම් විරහිත හා ද්වේෂ සහගත ප්‍රකාශන පොදු මහජනතාව අතර ප්‍රසිද්ධියට පත්වීම මත වසර විසි දෙකකට ආසන්න නොකැළැල් කීර්තිමත් වෘත්තිය ඉතිහාසයක් ඇති ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයෙකු හා ජනමාධ්‍යවේදියෙකු සමාජ ක්‍රියාකාරිකයකු වශයෙන් මාගේ සේවාදායකගේ කීර්ති නාමයට හා සමාජ තත්ත්වයට ඔබ විසින් බරපතළ හානියක් සිදුකර ඇති බවට මාගේ සේවාදායකයාගේ උපදෙස් මත දන්වා සිටිමි.

එමෙන්ම එකී සම්පූර්ණ අසත්‍ය සහ පදනම් විරහිත ද්වේෂ සහගත අසත්‍ය ප්‍රකාශ මහජනතාව අතර ප්‍රසිද්ධියට පත්කිරීම මත ජනප්‍රිය පුද්ගලයකු ලෙස මාගේ සේවාදායකගේ චරිතයට සමාජය තුළ ද්වේෂයක් අප්‍රසාදයක් හා/හෝ අපකීර්තියක් නිර්මාණය කිරීම තුළ මාගේ සේවාදායකගේ සාමකාමී ජීවන රටාව තර්ජනයකට හා/හෝ අවධානයකට ඔබ ලක් කර ඇති බව ඔහුගේ උපදෙස් මත දන්වා සිටිමි.

එකී අපහාසාත්මක ප්‍රකාශය හා/හෝ චෝදනා, ඔබ විසින් ස්වාධීනව, සිය කැමැත්තෙන්ම සහ/හෝ හිතාමතාම වෙනත් පරිභාහිර හේතුන් අරභයා මාගේ සේවාදායක කෙරෙහි;

i. ද්වේෂ සහගත චේතනාවෙන් (malice); සහ/හෝ
ii. ප්‍රකාශිත ද්වේෂයෙන් (express malice); සහ/හෝ
iii. හිංසක චේතනාවෙන් (animus injuriandi); සහ/හෝ
iv. අසද්භාවයෙන් (mala fide) කටයුතු කල බවත් ය.

තවද මාගේ සේවාදායකගේ උපදෙස් මත ප්‍රකාශ කර සිටින්නේ ඔබගේ ඉහත කී අපහාසාත්මක ප්‍රකාශය මුලුමනින්ම සහ/හෝ වෙන්වෙන්ව ගත් කලද එහි ස්වරූපයෙන්ම (per se) මාගේ සේවාදායක කෙරෙහි අපහාසාත්මක බවය.

එමෙන්ම මාගේ සේවාදායකගේ උපදෙස් මත තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ ඔබගේ ඉහත කී අපහාසාත්මක ප්‍රකාශය මුළුමනින්ම සහ/හෝ වෙන්වෙන්ව ගත් කලද වක්‍රාකාරයෙන්ද (innuendo) මාගේ සේවාදායක කෙරෙහි අපහාසාත්මක බවත්, විශේෂයෙන්ම එකී ප්‍රකාශය මගින් මාගේ සේවාදායක කෙරෙහි පහත සඳහන් සාවද්‍ කරුණු එකක් හෝ වැඩි ගණනක් හෝ සියල්ලම මහජනතාවට ඒත්තු ගන්වන බවත්, සහ/ හෝ අනුමිතියන් ඇතිකරන ලද බවත්, සහ/හෝ ව්‍යංගයෙන් අදහස් කරන බවත්, සහ/හෝ තේරුම් කර දී ඇති බවත්, සහ/හෝ අසාධාරණ ලෙස මහජනතාවට එසේ තේරුම් ගැනීමට සලස්වා ඇති බවය. එනම්,

(1). ඖෂධ නියාමන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිමින් නිළධාරීන්ට බලපෑම් කලබව.
(2). කෙහෙළිය අමාත්‍යවරයා සමග එක්ව බාල බෙහෙත් ඡාවාරම් කල බව.
(3). බාල බෙහෙත් ඡාවාරමට සම්බන්ධ බවට කෝප් කමිටුවේදී හෙළිදරව් වූ බව.
(4). දූෂිත පාලකයන් සමග එක්ව කටයුතු කල බව.
(5). බාල බෙහෙත් ජාවාරමට සම්බන්ධ බව

ඉහත කාරුණු එකක් හෝ කීපයක් හෝ සියල්ලට ඔබ දැන දැනම එකී කරුණු වල සත්‍යතාවය වසම් කරමින් මාගේ සේවාදායකගේ චරිතයට හා/හෝ කීර්ති නාමයට බරපතල හානියක් සිදුකරමින් ඔබ රටේ ජනතාව නොමග යවමින් දිගින් දිගටම අසත්‍ය ජනගත කිරීම සිදුකර ඇති බවට මාගේ සේවාදායකගේ උපදෙස් මත දන්වා සිටී.

එමෙන්ම මාගේ සේවාදායක නියෝජනය කල අධ්‍යක්ෂ මණ්ඩලය බාල බෙහෙත් ඡාවාරමට සම්බන්ද නොවන බවටත් සම්පූර්ණයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වැරදි තොරතුරු මත නොමග යවමින් හා අධ්‍යක්ෂ මණ්ඩල තීරණ උල්ලංඝණය කරමින් එකී ඡාවාරම ඉහළ නිළධාරීන් කිහිප දෙනෙකු එක්ව සිදුකල බවට දැනට පවතින අධිකරණ කටයුතු වලදී මෙන්ම සෞඛ්‍ය අමාත්‍යාංශයේ සිව් පුද්ගල විශේෂ පරීක්ෂණ වාර්තාව තුලින් සනාථ වි තිබියදී මෙවැනි අසත්‍යය චෝදනාවන් ඔබ විසින් මුළු රටේම ප්‍රචාරය වන ලෙස ප්‍රසිද්ධ සමාජ මාධ්‍ය ඉදිරියේ කර සිටීම හේතු කොට ගෙන අධිකරණමය කාර්යභාරයක කොටස්කරුවකු වන නීතිඥවරයකු වන පැමිණිලිකරුට පමණක් නොව පැමිණිලිකරු නියෝජනය කරන නීතිඥ වෘත්තීයටද ඔබගේ මෙම ප්‍රකාශය බරපතළ හානියක් සිදුකර ඇති බවට මාගේ සේවාදායකගේ උපදෙස් මත දන්වා සිටී.

තවද ඉහත සැබෑ සත්‍ය කරුණු ජනතාවගෙන් වසන් කරමින් යම් දේශපාලනික අරමුණක් උදෙසා හා/හෝ මහජනතාව කුපිත කරවීමේ අරමුණක් උදෙසා හා/හෝ අයුතු ලාභ ප්‍රයෝජනයක් ලැබීමේ අරමුණින් හා/හෝ මාගේ සේවාදායක කෙරෙහි ද්වේෂයෙන් ඔබ සිදුකර ඇති අසත්‍ය ප්‍රකාශ මගින් හා එකී ප්‍රකාශයන් සමාජ මාධ්‍ය මගින් ප්‍රසිද්ධියට පත් කර මාගේ සේවාදායකගේ කීර්ති නාමයට හා/හෝ චරිතයට දැනට සිදුකර ඇති හානිය රුපියල් මිලියන 600 කට තක්සේරු කරන මාගේ සේවාදායක මෙම ලිපිය ලැබී දින 14ක් ඇතුළත එකී රුපියල් මිලියන 600 ක වන්දි මුදල ඔහු වෙත ගෙවන ලෙස ඔබට දන්වා සිටීමට මාගේ සේවාදායක මා වෙත උපදෙස් ලබාදී ඇත.

තවද ඉහත කී පරිදි මගේ සේවා දායක ඉල්ලා ඇති එකී රුපියල් මිලියන 600 ක වන්දි මුදල ගෙවීම ඔබ විසින් පැහැර හැරියහොත් හා/හෝ නොසලකා හැරියහොත් එකී මුදල අයකර ගැනීම සඳහා නිසි බලය ඇති අධිකරණයක් හමුවේ නඩු පැවරීමට ඔහු මා වෙත වැඩිදුරටත් උපදෙස් ලබා දී ඇති බවද මෙයින් ඔබ වෙත දන්වා සිටිමි.

මෙයට,

...........................................
නීතිඥ ඩී.එම්.එම්.එම්.විජයරත්න